**වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදල - 2023**

**---------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම(එක් එක් මතයට අදාළ වන පරිදි)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූලා‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූලා‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූලා‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූලා‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූලා‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| ස්ථාවර තැන්පත් සඳහා වන පොලී මුදලින් සියයට 5 ක් වූ රඳවාගැනීම් බද්ද අඩුකොට ලැබිය යුතු ස්ථාවර තැන්පත් පොලිය ගණනය නොකිරීම හේතුවෙන් රු 12,634,663 කින් සමාලෝචිත වර්ෂයේ ආදායම වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරීම සඳහා අවශ්‍ය වන ගැලපීම් ඊළඟ මූලා‍ය ප්‍රකාශනවලදී සිදු කිරීමට කටයුතු කරන බව . | ස්ථාවර තැන්පත් පොලිය නිවරදිව ගණනය කර ගිණුම් ගත කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදල සඳහා වැඩිහිටි දීමනාවෙන් අයකරගත් මුදල් ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් නැවත අරමුදල වෙත ලබාදිය යුතු වුවත් පසුගිය වර්ෂයට අදාලව ලැබිය යුතු රු.1,682,400 ක මුදල සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් අරමුදල වෙත ලබාදී නොතිබුණි. | හිඟ මුදල් ගෙන්වා ගැනීමට තවදුරටත් ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් අයකල මුදල් කඩිනමින් අරමුදලට බැර කරවා කටයුතු කල යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15 ඡේදය මගින් ස්ථාපිත කර තිබුණු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 877(1)(ඇ) | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛණය සකස් කොට තිබුණද, අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය සහිතව මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගැනීම සඳහා ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමුකර එහි පිටපතක් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමුකළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | 2024 වර්ෂය සඳහා වන අයවැය ලේඛණය රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙතද යොමු කර ඇති බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 1.8 ආයෝජන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතට හඳුන්වා දුන් 2021 අංක 10 දරන දේශීය ආදායම් සංශෝධන පනතේ III වන උපලේඛනය අනුව 2021 අප්‍රේල් 01 දිනෙන් පසුව සමිතියකට උපචිත වන ඒ සමිතිය විසින් උපයන ලද පොලිය ආදායම් බද්දෙන් නිදහස්වේ. ඒ අනුව වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදලේ ස්ථාවර තැන්පත් සඳහා වන පොලියෙන් බැංකු විසින් රඳවාගෙන ඇති | මේ සම්බන්ධයෙන් අදාල නීතිමය තත්ත්වය පිළිබඳ තොරතුරු සොයා බලා කඩිනමින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව | පනත ප්‍රකාරව කටයුතු කර හිමිකම ලබාගැනීමට කඩිනමින් කටයුතු කල යුතුයි |

සියයට 5 ක බදු මුදල නිදහස් කර ගැනීමට හැකි වුවත්, එම හිමිකම ලබාගැනීමට අරමුදලේ කළමනාකාරිත්වය කටයුතු කර නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී කල්පිරුණු රු 2,941,701,428 ක් වූ ස්ථාවර තැන්පත් මත ලද පොලියෙන් රු 39,053,431 ක මුදලක් අරමුදලට බැර වී නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 99,401,346 අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 120,672,455 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 21,271,109 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ව්‍යාපෘති වියදම වැඩිවීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබූ බව නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| අඩු ආදායම්ලාභි වැඩිහිටි ප්‍රජාවගේ විශේෂ හා හදිසි අවස්ථාවලදී සෞඛ්‍යය, පෝෂණය හා ආරක්ෂණ වැය දැරීම හා වැඩිහිටියන්ගේ සුභසාධනය අරමුණු කර වැඩිහිටි දීමනාව ලබන ප්‍රතිලාභීන්ගේ, එක් ප්‍රතිලාභියෙකුගෙන් එක් මාසයක් සඳහා රු. 100 බැගින් වැඩිහිටි දීමනාවෙන් අයකර වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදල පිහිටුවීමට 2016 සැප්තැම්බර් 07 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව අරමුදල පිහිටුවූ 2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා එක් වැඩිහිටියකුගෙන් රු 100 බැගින් වැඩිහිටි දීමනාවෙන් අයකර රු. මිලියන 3,870.2 ක් අරමුදල් සම්පාදනය කරගෙන තිබුණි. අරමුදලේ කාර්යයන් 10 ක් මුල්කර ගෙන රැස්කරනු ලැබූ මෙම අරමුදලෙන් 2016 සිට 2018 වර්ෂය දක්වා කිසිඳු වැඩසටහනක් ක්‍රියාත්මක කර නොතිබුණි. ඒ අනුව වර්ෂ 7 ක් සඳහා මුළු දායකය රු මිලියන 3,870.2 ක් වන අතර එම කාලය සඳහා සුභසාධන වියදම රු මිලියන 1468.6කි. නමුත් ආයෝජනය රු. මිලියන 3546.9 කි එය ප්‍රතිශතයක් ලෙස සියයට 91.6 කි. මේ අනුව මෙම අරමුදලේ අරමුණ වැඩිහිටියන්ගේ සුභ සාධනය වෙනුවෙන් අරමුදල යොදා ගැනීම ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය විය. | රට තුළ පැවැති සමාජ, ආර්ථික දේශපාලනික කාරණා හේතුවෙන් අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කර ගත නොහැකි වූ බව. | අරමුදල ස්ථාපිත කිරීමේ අරමුණු ඉටුකර ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |

## 3.2 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 5.4.4 (i) වගන්තිය පරිදි පිළිගත හැකි අත්තිකාරම් ගෙවීමේ සුරක්ෂණයක් ඉදිරිපත් කිරීම මත, කොන්ත්‍රාත් මුදලින් සියයට විස්සක (20%) උපරිමයක් අත්තිකාරම් ලෙස 2022 මාර්තු 28 හා 2022 මැයි 18 දිනයන්හි රු. 58, 806, 933 ක මුදලක් අත්තිකාරම් ලෙස මුදාහැර තිබුණි. නමුත් ඊට අමතරව උක්ත අත්තිකාරම් මුදලෙන් 2022 දෙසැම්බර් 28 දිනට රු. 41, 600, 046 ක් නොපියවා තිබියදී නැවත 2022 දෙසැම්බර් 28 දින රු. 35,949,264 ක මුදලක් ද්‍රව්‍ය අත්තිකාරමක් ලෙස මුදාහැර තිබුණි. 2024 ජනවාරි 29 දින එනම් විගණිත අවස්ථාව වන විටත් උක්ත මුදල් මුදාහැර වසරකට වැඩි කාලයක් ගත වී තිබුණද එම අත්තිකාරම් මුදල් භාවිතා කර ඊට අදාල වැඩ විෂයයන් වල අදාල වැඩ නිමකර නොතිබුණි. අත්තිකාරම් මුදල් ලබා දීමෙන් මාස 05 කට පසු එම මුදලින් කොටසක් උපයෝගී කර ගනිමින් පළමු ටයිල් තොගය 2023 ජුනි 02 දින මිලදී ගෙන තිබුණි. පසුව වරින් වර ටයිල් මිලදී ගෙන තිබූ අතර අවසන් ටයිල් තොගය 2024 ජනවාරි 05 වන දින මිලදී ගෙන තිබුණි. විගණිත දිනය වන 2024 ජනවාරි 29 දින වන විටත් ටයිල් වලින් වැඩි ප්‍රමාණයක් භාවිතයට නොගෙන ගොඩ ගසා ඇති බව නිරීක්ෂණය විය. ඒ අනුව කොන්ත්‍රාත්කරු විසින් ඉතිරි වූ රු.18,369,827 ක අත්තිකාරම් මුදලක් වසරකටත් වැඩි කාලයක් තිස්සේ රඳවාගෙන තිබුණි | අත්තිකාරම් මුදල කොන්ත්‍රාත්කරු වෙත සපයනු ලැබුවේ එවකට රටේ පැවති ආර්ථික අස්ථාවරත්වය මත ව්‍යාපෘතිය අතරමග නතරවීම වලක්වා ගැනීමේ අරමුණින් ටයිල්, වැසිකිලි සනීපාරක්ෂක උපකරණ හා සවිකිරීම සහ විදුලි සෝපානය යන අයිතම මිලදී ගැනීම සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් ලබා දීමට පමණක් වන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13.3 වගන්තිය ප්‍රකාරව අවිනිශ්චිත ප්‍රතිපාදනය කොන්ත්‍රාත් ගත මුදලින් සියයට 10 නොඉක්මවිය යුතු අතර ගිවිසුම අනුව අවිනිශ්චිත ප්‍රතිපාදනය සියයට 7 ක් ලබා දීමට එකඟවී තිබියවදී ඊට පටහැනිව සියයට 38.79 කින් කොන්ත්‍රාත් මිල එනම් රු. 115,860,352 කින් වැඩි කිරීමට අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව අනුමැතිය ලබාදී තිබුණි | අනපේක්ෂිත අයුරින් රට තුල ඇතිවූ ආර්ථික අස්ථාවරභාවය හේතුවෙන් CIDA ආයතනය මගින් ඉදිරිපත් කරන ලද මිල සූත්‍රයට අනුව ගෙවීම් කිරීමට සිදුවූ බැවින් උපදේශන ආයතනයේ නිර්දේශිත මිල විචලනය සඳහා ගෙවීම අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව අනුමත කර ඇති බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
| --- | --- | --- |
| වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදලේ ප්‍රතිපාදන මත කතරගම වැඩිහිටි නිවාසය ඉදිකිරීම පුද්ගලික ආයතනයට රු. 298,684,667 ක බදු රහිත මුදලකට  පවරා තිබුණි. ගිවිසුම් ප්‍රකාරව මෙම කර්මාන්තය 2022 මාර්තු 15 දින ආරම්භවී 2023 සැප්තැම්බර් 12 දින නිම කළ යුතුව තිබුණි.  පළමු කාලය දීර්ඝ කිරීම 2023 සැප්තැම්බර් 12  සිට 2023 නොවැම්බර් 27 දක්වා  ඉල්ලා තිබූ අතර එය දින 76 කින් අවසන් කිරීමට නියමිත විය. නමුත් එදිනට වැඩ අවසන් නොවීම හේතුවෙන් දෙවන කාලය දීර්ඝ කිරීම 2024 මාර්තු 31 දක්වා දින 125 ක් කොන්ත්‍රාත්කරු විසින් ඉල්ලා තිබුණද වැඩිහිටි මහලේකම් කාර්යාලය විසින් 2024 ජනවාරි 31 දක්වා දින 65 ක කාලය දීර්ඝ කිරීමක් ලබා දී තිබුණි. ඒ අනුව කොන්ත්‍රාත් කාලය නිම වී තිබුණත් කර්මාන්තයෙන් අඩක්වත් එදිනට නිම කර නොතිබුණි. | මෙම ව්‍යාපෘතිය පශ්වාත් කොවිඩ් සමයේ බලපෑම්, ඉන්ධන හිඟකම, ,දීර්ඝ විදුලිය කප්පාදුව, වරින් වර පනවන ලද සංචරන සීමා සහ ජනතා අරගල වැනි අතිවිශේෂ තත්වයන් ඇතිවූ කාල පරාසයක ක්‍රියාත්මක වූවක් බැවින් ව්‍යාපෘතිය සඳහා එය සැලකිය යුතු බාධාවක් වුවත් ඒවා ගණනය කිරීමට සම්මත ක්‍රමවේදයක් නොමැති බැවින් එමගින් ඇතිවූ ප්‍රමාදයන් නොසලකා හැරීමට සිදුවූ බව | ව්‍යාපෘති නියමිත කාලය තුල ගිවිසුම ප්‍රකාරව කඩිනමින් ඉටුකර ගැනීමට කටයුතු කල යුතුය. |